# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1404/9 – 2005 අගෝස්තු 03 වැනි බදාදා – 2005.08.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මහනුවර නාගරිකය

ජල භීතිකා රෝගය පිළිබඳ ආඥාපනතේ (1894 ජනවාරි මස 02 වන දින) අංක 11 (1) ඡේදය යටතේ කරනු ලබන දැන්වීම

ජල භීතිකා රෝගය පිළිබඳ ආඥාපනතේ අංක 11 ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියමිත අධිකාරි තැන වූ මහනුවර පුරපති කේසර ඩී. සේනානායක වන මම 2005.07.29 දින පවත්වන ලද මහනුවර මහ නගර සභාවේ අංක 8 (5) දරන සභා සම්මුතිය අනුව, මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය ජල භීතිකා රෝග බිය ඇති ප්‍රදේශයක් ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එලෙස ප්‍රකාශයට පත් කිරීම එම සභා සම්මුතියේ සඳහන් දින සිට මසක කාලයක් සඳහා වලංගු වන අතර, එම කාල සීමාව තුළ නගර සභා සීමාව ඇතුළත පිහිටි කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ මාර්ගයක නැතහොත් පුද්ගලික ගොඩනැගිල්ලක්, මිදුලක් හෝ ගෙවත්තක් නොවන කිසියම් තැනක සිට හමුවන ලද නොබඳින ලද හෝ දක්කාගෙන නොයනු ලබන කවර බල්ලෙක් වුවද, එම කාර්යය සඳහා මා විසින් හෝ නාගරික කොමසාරිස් විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලිපියකින් බලය දෙනු ලැබූ කවර තැනැත්තෙකු විසින් හෝ විනාශ කර දැමීමට යටත්වේ.

කේසර ඩී. සේනානායක,<br>
මහනුවර පුරපති,

08-640


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.